රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛ: 05/2011(I)

මගේ අංකය: PSC/EST/1/7/1/2011
රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්යාලය
අංක 177
නාවල පාර
නාරාහේන්පිට
2011 දෙසැම්බර් මස 29 දින

සියළුම අමාත්‍යාංශ ලේකම්වරුන්
පළාත් සභා ප්‍රධාන ලේකම්වරුන් සහ
දෙපාර්තමේන්තු ප්‍රධානීන් වෙත

**රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ පරිපාලන කාර්යයන් පිළිබඳ බලතල පැවරීම**

ඉහත කරුණ සම්බන්ධයෙන් නිකුත් කරන ලද 2011-12-13 දිනැති රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛ 05/2011 කෙරෙහි ඔබගේ අවධානය යොමු කරවමි.

02. එහි 02 ඡේදයේ I යටතට පහත සඳහන් කොටසද ආදේශ කරනු ලැබේ.

I) 

| බලතල පැවරීමට යටත්වන සේවාවන්/නිලධාරීන් | පරිපාලන බලතල පවරනු ලබන බලධාරීන් |
|---|---|
| -ශ්‍රී ලංකා වෛද්‍ය සේවය | සෞඛ්‍ය විෂය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්/ අමාත්‍යාංශයේ ලේකම් විසින් නම් කරනු ලැබූ, අතිරේක ලේකම් තනතුරට වඩා පහළ තනතුරක නොවන, රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අනුමත කරනු ලබන නිලධරයෙකු. |
| -ශ්‍රී ලංකා මිනින්දෝරු සේවය | ඉඩම් මැනුම් විෂය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම් / අමාත්‍යාංශයේ ලේකම් විසින් නම් කරනු ලැබ, රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අනුමත කරනු ලබන අතිරේක ලේකම්වරයෙකු |

රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියමය පරිදි

ඩබ්.එම්.එල්.සී. සේනාරත්න
ලේකම්
රාජ්‍ය සේවා කොමිෂන් සභාව.